# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2022

2025 - ජුලි

**BCOME 4073** - ව්‍යාපෘති කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

ග්‍රීන් බිල්ඩ් කන්ස්ට්‍රක්ෂන් පුද්ගලික සමාගම යනු ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රමාණයේ ඉදිකිරීම් සමාගමක් වන අතර එය මෑතකදී තිරසාර ප්‍රජා නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා රජයේ කොන්ත්‍රාත්තුවක් ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘතියට, මාස 18ක් ඇතුළත ග්‍රාමීය ප්‍රදේශයක පරිසර හිතකාමී නිවාස 50ක් ඉදිකිරීම ඇතුළත් වන අතර මුළු අයවැය රුපියල් මිලියන 800 කි.

මෙම ව්‍යාපෘතිය පුනර්ජනනීය බලශක්තිය සහ තිරසාර ජීවන රටාව ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ ගන්නා ලද ආරම්භක පියවරකි. සෑම නිවසකටම සූර්ය පැනල, වැසි ජලය රැස්කිරීමේ පද්ධති සහ පරිසර හිතකාමී ද්‍රව්‍ය ඇතුළත් විය යුතුය. ග්‍රීන් බිල්ඩ් ව්‍යාපෘති කළමනාකරු ලෙස නුවන් මහතා පත් කර ඇත.

ව්‍යාපෘතියේ මාස තුනකට පසු, නුවන් මහතා විසින් අභියෝග කිහිපයකට මුහුණ දී ඇත:

- **සම්පත් සීමාවන්**: ආනයන ප්‍රමාදයන් හේතුවෙන් පුහුණු ශ්‍රමයේ සහ පරිසර හිතකාමී ඉදිකිරීම් ද්‍රව්‍යයන්හි හිඟය.
- **පාර්ශවකරුවන්ගේ ගැටළු**: විභව පාරිසරික හානිය පිළිබඳව ප්‍රාදේශීය ප්‍රජාව විරෝධතා දැක්වීම ආරම්භ වී ඇති අතර, රජය විසින් මාසික ව්‍යාපෘති ප්‍රගති වාර්තා අපේක්ෂා කරනු ලබයි.
- **කාලය ඉක්මවා යාම**: අනපේක්ෂිත මෝසම් වැසි විසින් ආරම්භක මට්ටමේ මූලික කටයුතු ප්‍රමාද කර ඇත.
- **පිරිවැය වැඩිවීම**: විනිමය අනුපාත උච්චාවචනයන් හේතුවෙන් ආනයනික සූර්ය පැනලවල මිල 15% කින් වැඩි වී ඇත.

නුවන් හදිසි ව්‍යාපෘති කණ්ඩායම් රැස්වීමක් ඉල්ලා සිටියේය. දැන් ඔහු ව්‍යාපෘති සැලැස්ම සංශෝධනය කළ යුතුය, පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් කළමනාකරණය කළ යුතුය, සහ සීමාවන් තුළ ව්‍යාපෘති අරමුණු තවමත් සාක්ෂාත් කරගත හැකි බව සහතික කළ යුතුය.නව ව්‍යාපෘති උපදේශක ලෙස, ග්‍රීන් බිල්ඩ් ව්‍යාපෘතිය සාර්ථකව කළමනාකරණය කිරීමේදී නුවන් මහතාට මග පෙන්වන ලෙස ඔබෙන් ඉල්ලා සිටී.

මෙම තත්ත්වය තුළ නුවන් මහතා විසින් ප්‍රමුඛත්වය දිය යුතු ප්‍රධාන **ව්‍යාපෘති කළමනාකරණ දැනුම ක්ෂේත්‍ර පහක්** හඳුනාගෙන පැහැදිලි කරන්න.

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 02**

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ නිෂ්පාදන සමාගමක් වන **ටෙක් නෝවා පුද්ගලික සමාගම**, එහි මෙහෙයුම් සහ තීරණ ගැනීම වැඩිදියුණු කිරීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. ව්‍යාපෘතියේ කාලසීමාව මාස 12ක් වන අතර රුපියල් මිලියන 500 ක අයවැයක් සහිත වේ.පත් කරන ලද **ව්‍යාපෘති උපදේශක** ලෙස, ටෙක් නෝවා ව්‍යාපෘතියේ ජීව චක්‍ර අදියර හරහා ERP ව්‍යාපෘතිය කෙතරම් හොඳින් කළමනාකරණය කරන්නේද යන්න ඇගයීමට ඔබෙන් ඉල්ලා සිටිනු ලබයි.

අ). ව්‍යාපෘති ජීව චක්‍රයේ අදියර හතර නිර්වචනය කර එක් එක් අදියරට සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරකම් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

ආ). ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය ක්‍රියාත්මක කිරීම වැනි සංකීර්ණ ව්‍යාපෘතියක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති ජීව චක්‍ර ප්‍රවේශය ඵලදායී ලෙස භාවිතා කිරීම කෙතරම් උපකාරී විය හැකිද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 03**

පහත දැක්වෙන මාතෘකා අතරින් 5ක් තෝරාගෙන, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.

අ) ව්‍යාපෘති කඩිනම් කිරීම (Project crashing)

ආ) ව්‍යාපෘති ප්‍රඥප්තිය (Project charter)

ඇ) ව්‍යාපෘති ප්‍රසම්පාදනය (Project procurement)

ඈ) ව්‍යාපෘති තත්ත්ව කළමනාකරණය( Project quality management)

ඉ) ව්‍යාපෘති වසා දැමීම (Project closure)

ඊ) ව්‍යාපෘති කළමනාකරණ ව්‍යුහයන් (Project management structures)

උ) ගැන්ට් ප්‍රස්ථාර (Gantt charts)

ඌ) ව්‍යාපෘති අවදානම් (Project risks)

**(මුළු ලකුණු 5 x 5 = 25)**

**ප්‍රශ්න අංක 04**

ADB ඉදිකිරීම් සමාගම මෑත අතීතයේ දී ඉහළ පෙළේ ව්‍යාපෘති කිහිපයක් භාරගෙන ඇති අතර රටේ ඉදිකිරීම් කර්මාන්තයේ මිණුම් ලකුණක් නියම කරන ප්‍රමුඛ ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කර ඇත. ඔබව සමාගමේ නව ව්‍යාපෘති කළමනාකරු ලෙස පත් කර ඇත. පහත වගුවේ සමාගමේ යෝජිත නව ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම්, ආසන්නතම පූර්ව ක්‍රියාකාරකම් සහ ඒවායේ නිශ්චිත කාල සීමාව දක්වා ඇත.

| ක්‍රියාකාරකම | ආසන්නතම පූර්ව ක්‍රියාකාරකම | නිම කිරීමේ කාලය (දින) |
|---|---|---|
| **A** | - | 2 |
| **B** | - | 7 |
| **C** | - | 4 |
| **D** | A | 5 |
| **E** | D | 9 |
| **F** | E | 3 |
| **G** | B | 5 |

අ) තීරණාත්මක මාර්ග සටහන (Critical Path Method) භාවිතයෙන් ව්‍යාපෘතියට තීරණාත්මක වන ක්‍රියාකාරකම් තෝරන්න.

(ලකුණු 10)

ආ) ඉහත ව්‍යාපෘතියේ මුළු නිම කිරීමේ කාලය (දින වලින්) ගණනය කරන්න ?

(ලකුණු 05)

ඇ) ක්‍රියාකාරකම G සඳහා කලින් අවසන් කිරීමේ කාලය (early finish time) (දින වලින්) ගණනය කරන්න?

(ලකුණු 05)

ඈ) ක්‍රියාකාරකම G සඳහා ප්‍රමාද වූ ආරම්භක කාලය (late start time) (දින වලින්) ගණනය කරන්න?

(ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 05**

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සමාගමක් වන **සොලාර් සිටි පුද්ගලික සමාගම**, මාස 18ක් තුළ බස්නාහිර පළාත පුරා නේවාසික සූර්ය පද්ධති 1,000ක් ස්ථාපනය කිරීම අරමුණු කරගත් වහල මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘතියක් දියත් කිරීමට සැලසුම් කරයි. සමාගමට ජාත්‍යන්තර පරිත්‍යාගශීලී ආයතනයකින් අරමුදල් ලැබුණු අතර ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 800ක අයවැයක් වෙන් කරන ලදී.

ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා, **සොලාර් සිටි පුද්ගලික සමාගමේ** ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහතික කළ ව්‍යාපෘති කළමනාකරුවෙකු වන කමල් මහතා පත් කර ඇති අතර පළමු පියවර ලෙස ව්‍යාපෘති ප්‍රඥප්තියක් සකස් කිරීමට ඔහුට උපදෙස් දී ඇත.

ව්‍යාපෘති කළමනාකරණ උපදේශකයෙකු ලෙස,

අ) ව්‍යාපෘති ප්‍රඥප්තියක (project charter) අරමුණ සහ ව්‍යාපෘති කළමනාකරණයේදී එහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) වහල මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රඥප්තියට ඇතුළත් කළ යුතු ප්‍රධාන සංරචක හයක් හඳුනාගෙන විස්තර කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 06**

මෙට්‍රෝබ්‍රිජ් සමාගම විසින් ශ්‍රී ලංකාවේ කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් භාරගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ අයවැය රුපියල් බිලියන 1.2 ක් වන අතර මාස 24 ක කාල රාමුවක් දරනු ලබයි. ව්‍යාපෘතිය අරඹා මාස හයකට පසු, අනපේක්ෂිත අධික වර්ෂාව නිසා අත්තිවාරම් කටයුතු වලට හානි සිදු වීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද විය. වානේ මිල ඉහළ යාම සහ දක්ෂ ශ්‍රම හිඟය නිසා පිරිවැය තවදුරටත් ඉහළ ගොස් ඇත. ඊට අමතරව, පාරිසරික ගැටළු සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් විරෝධතා දැක්වීමට පටන් ගෙන ඇත. තවදුරටත් සිදුවිය හැකි පසුබෑම් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරු විසින් ඉතා ඉක්මනින් මෙම අවදානම් හඳුනාගෙන, තක්සේරු කර, අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

අ) ව්‍යාපෘති කළමනාකරණයේ අවදානම් කළමනාකරණය නිර්වචනය කර එහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 5)

ආ) ඉහත ව්‍යාපෘතියට අදාළ අවදානම් හතරක් හඳුනාගෙන ඒවා අභ්‍යන්තර හෝ බාහිර ලෙස වර්ගීකරණය කරන්න.

(ලකුණු 6)

ඇ) ව්‍යාපෘති කළමනාකරුට භාවිතා කළ හැකි අවදානම් අවම කිරීමේ උපාය මාර්ග තුනක් යෝජනා කරන්න.

(ලකුණු 14)

**(මුළු ලකුණු 25)**